# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික 1 පරීක්ෂණය
ප්‍රථම වසර
**2017/2018 Academic Year - Semester 1 Examination**
**First Year**

## සිංහල ලේඛන කුසලතා – FNDS 11013

එක් කොටසකින් එක් ප්‍රශ්නයක්වත් ඇතුළත් වන සේ ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු 20 ක් පමණි. කාලය පැය 02 යි.

---

### I කොටස

01.

I. අක්ෂර වින්‍යාස ගැටලු ඇති වීම කෙරෙහි බලපාන හේතු සාධක පෙන්වා දෙන්න.

II. විකල්ප රීති යනුවෙන් හඳුන්වන්නේ මොනවාද? නිදසුන් සහිතව විමසන්න.

02. පහත දැක්වෙන වචනවල අක්ෂර වින්‍යාසයේ වැරදි ඇති නම් නිවැරදි කර ලියා දක්වන්න.

I. අත්‍යාලංකාර
II. ආශිර්වාදය
III. ඓෙරාවණ
IV. මයූර සන්දේශය
V. විශිස්ට
VI. කුණ්ඩලිය
VII. දයාලු
VIII. චන්දය
IX. භීෂනය
X. ප්‍රතිඵල
XI. විහාරස්ත
XII. ශීඝ්‍රගාමි
XIII. පරිවර්තනය
XIV. මැදූර
XV. ත්‍යාග ප්‍රදානය
XVI. කෝට්ටාශය
XVII. තෘෂ්ණා
XVIII. නිශ්පාදනය
XIX. විශ්මය
XX. ප්‍රසස්ති

03.

I. කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ ප්‍රමාණවත් සටහනක් පිළියෙල කරන්න.

II. පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

a) සේවිකාවක් දරුවන් බලයි.
b) මවක් දැරියක නළවයි.
c) පියාණෝ දරුවෙකු කැඳවති.
d) හෙදියෝ දැරියන් අමතති.
e) යහළුවෙක් මා කැඳවයි.

## II කොටස

01. පහත දැක්වෙන පාඨය වචන 1/3 වන සේ සාරාංශ කොට ලියා සුදුසු මාතෘකාවක් යොදන්න.

අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සම්මත මත ද, එහි පැවැත්ම ද කලින් කලට වෙනස් වේ. එහෙත් කිසි ම අධ්‍යාපන ක්‍රමයක් බාහිර සාධකයන්ගෙන් වෙන් ව නොපවතී. අධ්‍යාපන සමාජයෙහි විවිධ බලවේගයන් බිහි කරන අතර එය එවැනි විවිධ බලවේගයන්ගේ ක්‍රියාකාරිත්වයෙහි සහ ප්‍රතික්‍රියාකාරිත්වයෙහි ප්‍රතිඵලයක් ද වේ. වර්තමාන ලෝකයේ සීඝ්‍රයෙන් වෙනස් වන සමාජයෙහි අධ්‍යාපනය ගතානුගතිකව නිමැවුණු අනම්‍ය ව්‍යුහයක් තුළට පත් කිරීම අසතුටුදායක දෙයක් මෙන් ම කළ නොහැක්කක් ද වේ. එසේ ම නොපෙනෙන තරම් දීර්ඝ අනාගතයක් සඳහා සැලැසුම් කිරීම ද නොකළ යුත්තකි. වර්තමානය සීඝ්‍ර පරිවර්තන සමයයෙකි. හැම මනුෂ්‍ය ක්‍රියාවලියක්, ප්‍රයත්නයක් හා විද්‍යා ශාස්ත්‍රයක් කෙරෙහි ම දීර්ඝ කාලීන වශයෙන් බල පවත්වන ගැඹුරු පර්යේෂණ ද ගමනාගමන හා අදහස් හුවමාරු කිරීමේ වේගවත් ක්‍රම ද ජීවිතය සම්බන්ධ එදිනෙදා ප්‍රශ්න ද නිසා සමාජය බොහෝ සෙයින් ම සංකීර්ණභාවයට පත් ව ඇත්තේ ය. නවීන සමාජය සමග ඉදිරියට ගමන් කිරීමේත් එහි අනාගතය සැකැසීමේත් විශාල වගකීම අද අධ්‍යාපනයට භාර ය. මෙම සංකීර්ණ වර්තමාන ලෝකයෙහි සාර්ථක අන්දමින් ජීවත් වීම සඳහා අවශ්‍ය දැනීම් සම්භාරය සිතිය නොහැකි තරම් විශාල වී තිබේ. අද පාසල් යන හැම දරුවෙකු ම තම පියා එම වයසේ දී දැන සිටියාට වඩා අතිශයින් විශාල දැනුමක් ඇත්තකු විය යුතු ය. බොහෝ විට එම දැනීම වඩ වඩාත් ගැඹුරට ලබා සිටිය යුතු නිසා ඔහුගේ දෘෂ්ටිය පටු වී ඇත. වර්තමාන මිනිසාගේ ඇසට කනට ලක් වන දර්ශන සහ ශබ්ද සම්භාරයෙන් හේ කම්පනයට පත් වෙයි. හැම දිනක ම හැම මොහොතකම පුවත් පත්වලින්ගුවන් විදුලියෙන් සහ චිත්‍රපටවලින් තොරතුරු රාශියක් අපගේ ඉන්ද්‍රියයන් වෙත එල්ල වන අතර එ මගින් ඉතා ම මන්ද බුද්ධිකයාට පවා යම් දැනුමක් නොලබා සිටිය නොහැකි ය. ඒ නිසා මේවා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අධ්‍යාපන මාධ්‍යයෝ වෙති. හොඳට හෝ නරකට හෝ ඒවායේ ඇති බලය ඉමහත් වේ. අදහස් විපරීත කිරීම සහ බලයෙන් ආරෝපණය කැරවීම සඳහා මේ මාධ්‍යයන් හිතාමතා ම වැරැදි ලෙස යොදා නොගන්නා වූ ලෝකයේ නිදහස් රටවල අධ්‍යාපනය සතු වගකීම් භාරය අතිශයින් ම විශාල ය. අධ්‍යාපන ක්‍රියාවලියේ පූර්ණ ප්‍රතිඵලය නිතර ම සිහියේ තබා ගත යුතු ව ඇත. ඇතැම් කරුණුවලට අවධානය යොමු කැර අන්‍ය කරුණු අමතක කැරෙන අධ්‍යාපන ක්‍රමයක් සතුටුදායක ය යි පිළිගත නොහැකි ය. එසේ වූ විට බාල පරම්පරාව එක් අංශයකට පමණක් නැඹුරු ව වැඩෙන අතර ඔවුහු ජීවිතය පිළිබඳ සමතුලනතාවක් නැත්තෝ වෙති. ජීවිතය සැපවත් දැ හැකි තරම් ප්‍රමාණයක් ලබා ගැනීමේ මිනිස් රුචියේ අවසාන පරමාර්ථය සේ සැලකෙන ඉන්ද්‍රිය පිනවන පහසුකම්වලින් පරිපූර්ණ වර්තමාන සමාජයෙහි අධ්‍යාපනය නැමැති යහමග යවන බලවේගය සුපරීක්ෂාකාරී ව සැලසුම් කළ යුතු වේ.

02. පහත සඳහන් ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ  පද වෙන් කොට, විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

අහාප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමීනිඔබනොමැතිවගෙවීගියශීතඍතු වමටග්‍රීෂ්මයක්මවියදැන්වසන්තඍතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනි පවත්වතිමුළුපරිසරයමසශ්‍රීකත්වයෙන්බරවීඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරයාණෙ නිමාප්‍රේමියනිමටසමාවුවමැනවඅපගේපෞද්ගලිකසුඛවිහරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅ භිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්වයෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටග ලවාගැනීමේකාර්යයෙහිව්‍යාවෘතවසිටිනබැවින්සේනාසංවිධානයටමුල්තැනදීමටසිදුවියඒකෙසේවු වත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමේසැකසූරළුභෝජනයඅනුභවකොට මල්පහන්ගෙනවහවහාඅපිඉසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමී නිඅපිවිහාරයවැඳදියපොකුණඅබියසඋද්‍යානයටයමුමාප්‍රියසුහදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුද කලාවමයඔබගේනෑදෑයෝදමටනොයෙකුත්ඇනුම්පදකියතිවඳඑකියකැයිනිග්‍රහකරතිඅනේමාප්‍රිය යමටඔබවැනිමපුත්රුවනකලබාදෙන්නැයිඇඔහුගේඇකයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මි මිණුවායප්‍රේමියමමඑයඉටුකරන්නෙමියිඔහුඇයදැඩිවමළයටසමීපකරගත්තේය

03. භාෂාව හා උපභාෂාව අතර වෙනස පැහැදිලි කොට ඔබ කැමති සිංහල වෘත්තික උපභාෂාවක් (Occupational Dialect) පිළිබඳ විමසීමක් කරන්න.